ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන මගින් ලබාදෙන වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව, එම ආයතනයේ අපේක්ෂණ ඉටුකෙරේද යන්න සලකා බැලෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්.

ඩබ්ලිව් . ඩබ්ලිව් .එම්. සිරිවර්ධන(94/එම්.පිල්.43)
(බී.එස්සී : පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා විශිෂ්ඨ සම්මාන)

STOCK VERIFICATION
UCLIB
516664
Acc. No. 516664

කොළඹ විශ්ව විද්‍යාලයයේ අධ්‍යාපන දර්ශනපති විභාගය සඳහා ඉදිරිපත් කෙරෙන නිබන්ධය.
2002-ඔක්තෝබර්-01

University of Colombo Library Sri Lanka

## අධ්‍යයන සාරාංශය.

මෙම පර්යේෂණය ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන මගින් ලබාදෙන වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව තුලින්, එම ආයතනයේ අපේක්ෂණ ඉටුවේද යන්න සලකා බැලෙන විමර්ශණාත්මක වර්ගයේ අධ්‍යයනයකි. මෙහිදී ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය 1996 වසරේ තරම් ඉතා මෑතදී පිහිටුවන ලද්දක් වූ බැවින් ඊට සම්බන්ධ වූ පර්යේෂණයක් කිරීම සුදුසුයැයි තීරණය කරනු ලැබිය. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පිහිටුවීමේ අරමුණු විමර්ශණය කිරීම, ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන්හි ව්‍යාප්තිය ප්‍රගතිය සහ පවත්වනු ලබන පාඨමාලාවල ස්වභාවය සෙවීම, වෘත්තීය පුහුණුව ස්ථාපිත කිරීමේදී ඇතිවන ගැටලු සහ දුෂ්කරතා අනාවරණය කර ගැනීම, වෘත්තීය පුහුණු පාඨමාලා හැදෑරූ සිසුන්ට මෙම පාඨමාලා කෙතරම් උපකාරී වූයේදැයි අනාවරණය කරගැනීම සහ ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සහ වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයන් අනාවරණය කර ගැනීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු විය.

මෙහිදී පර්යේෂණය සඳහා තෝරාගත් නියැදිය සඳහා දිවයින පුරා ව්‍යාප්තවූ ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන නියැදියෙන් මාතර, හම්බන්තොට සහ කලුතර යන දිස්ත්‍රික්කයන් තුනෙහි ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන හයක සිසුන් 240 ක් පාඨමාලා හදාරන සිසුන් නියැදිය ලෙසද, උපදේශකවරුන් 44ක් උපදේශක නියැදිය ලෙසද, පාඨමාලා නිමකළ සිසුන් නියැදිය ලෙස මෙම මධ්‍යස්ථානයන් හි පාඨමාලා නිමකළ සිසුන් 100 ක් ද, මෙම මධයස්ථානයන්හි භාරකරුවන්, දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්, සංවර්ධන අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කාර්යාලයේ පර්යේෂණ අධ්‍යක්ෂවරයා නිලධාරී නියැදියට ද තෝරාගනු ලැබිය.

පර්යේෂණය සඳහා දත්ත රැස් කිරීමේදී ප්‍රශ්නාවලි මගින් සම්මුඛ සාකච්ඡා සහ ලිඛිත මූලාශ්‍රයන් ඇසුරින් දත්ත ලබා ගන්නා ලදි. නිලධාරී නියැදිය මගින් තොරතුරු ලබාගැනීම සඳහා ප්‍රධාන

වශයෙන් භාවිතා කරනු ලැබුයේ සම්මුඛ සාකච්ඡා ක්‍රමයයි. මෙහිදී පෙර සැකසූ පිරික්සුම් පතකට අනුව සම්මුඛ සාකච්ඡා පවත්වනු ලැබූ අතර අවශ්‍ය අනෙක් තොරතුරු වේ නම් ලිඛිත මූලාශ්‍රයන් ද ලබාගන්නා ලදි. පාඨමාලා නිමකළ සිසුන්ගේ පෞද්ගලික ලිපිනයන් අදාල මධ්‍යස්ථාන මගින් ලබාගෙන ඔවුන් වෙත ලිපිනය ලියූ මුද්දර කවරයක් සමග ප්‍රශ්නාවලිය තැපැල් කරනු ලැබිය. මෙහිදී ලැබුණ ප්‍රතිචාරය සියට 37කි. එම 37දෙනා පිරික්සුම් පතකට අනුව සම්මුඛ සාකච්ඡාවකට ලක්කරනු ලැබිය. රජයේ ප්‍රකාශන, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ වාර්ෂික වාර්තා, අභ්‍යන්තර පර්යේෂණ වාර්තා සහ අධිකාරියේ වෙනත් ප්‍රකාශන භාවිතා කරනු ලැබිය. මෙසේ ලබාගත් දත්ත ප්‍රතිශත, ප්‍රස්තාර වගු සහ රූපසටහන් ආශ්‍රයෙන් විශ්ලේෂණ කරනු ලැබිය. ප්‍රශ්නාවලි මගින් මුලින්ම දත්ත ලබා ගැනීමේදී ලැබුණු ප්‍රතිචාරයන් ඒකාකාරී වූ බැවින් ප්‍රශ්නාවලිය මාර්ගෝපදේශක ආචාර්යවරයාගේ උපදෙස් මත නැවත සකස් කරනු ලැබිය.

දත්ත විශ්ලේෂණයට අනුව ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන් හි ව්‍යාප්තිය උතුරු නැගෙනහිරට ඉතා සීමිත වූ බව පෙනී ගිය අතර ව්‍යාප්ත වීමේ සීඝ්‍රතාවය වසර පහක් ඇතුළත දී උපරිම තත්වයකට පැමිණ ඇති බව ද පෙනී ගියේය. එහෙත් එය බාහිර සාධක මත නොව ආයතනයේ අභ්‍යන්තරික සීමාකාරී සාධක නිසා බව පෙනීයයි. මෙම සීමාකාරී සාධක වන්නේ උපදේශකවරුන්ගේ ඌනතාව, භෞතික සම්පත් ඌනතාව, මූල්‍ය සම්පත් හිඟකම සහ පාඨමාලා නවීකරණය නොවීම යන ඒවාය. ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීමේ අරමුණු ශිෂ්‍ය සහභාගිත්වයට සාපේක්ෂව සැලකූ විට ඉටු නොවන බවක් පෙනේ. එක් මධ්‍යස්ථානයකට සිටින ශිෂ්‍ය සංඛ්‍යාව සමස්තයක් ලෙස සැලකූ විට 98 කි. කිසිම මධ්‍යස්ථානයක මෙම අගය 120 ඉක්මවා ගියේ නැත. සමහර දිස්ත්‍රික්කයන්හි මධ්‍යස්ථාන සංඛ්‍යාව ඉහළ වුවත් ශිෂ්‍ය අනුපාතය පහළ අගයක් ගනී. මෙය දේශපාලනික බලපෑම් නිසා වූවක් බව ද පෙනී යයි. එසේම මධ්‍යස්ථාන උපදේශකවරුන් දිවයින පුරා සමාකාරව විසිරී නොමැත්තේ බඳවාගැනීම් වලදී සිදුවූ දේශපාලනික බලපෑම් බවද පෙනී යන කරුණකි. එසේම පාඨමාලා 69 ක් හඳුන්වා දී තිබුණද මෙම මධ්‍යස්ථානයන් හි සහ

දිස්ත්‍රික්කයන් හි ක්‍රියාත්මක වූ පාඨමාලා සංඛ්‍යාව 15 කි. මධ්‍යස්ථානයන්හි සම්පත්වල ඌනතාවය පාඨමාලා කෙරේ දැඩි බලපෑමක් කර ඇති බවද පෙනේ. කැඩුණු උපකරණ අලුත්වැඩියාව, යන්ත්‍ර නඩත්තුව හා සේවාවන් නිවැරදිව හෝ නිසිකලට ඉටුවන බවක් දක්නට නැත. වෘත්තීය අධ්‍යාපනයේ සහ පුහුණුවේ අංගයක් ලෙස සැලකෙන අන්තර්ජාතික භාෂාවක් ඉගැන්වීම මෙම මධ්‍යස්ථානවල ක්‍රියාත්මක වුනද එය නාමික තත්වයට පමණක් බව පෙනීයන තවත් කරුණකි. මෙම පුහුණු ලාභීන්ගේ වයස් අනුව සැලකූ විට සියයට 84ක බහුතරයක් අවුරුදු 17ත් අවුරුදු 23ත් අතර වූ අය වේ. එසේම ඔවුන්ගේ සියයට 84ක් අ.පො.ස.(සාමාන්‍ය පෙළ) හෝ ඊට ඉහළ සමතුන් වීම කැපී පෙනෙන ලක්‍ෂණයකි.

ශ්‍රී ලංකා මහබැංකු වාර්තා අනුව අවු 15 සහ අවු 30 අතර වූ සේවා වියුක්ති බලකායෙන් කොටසක් ලෙස සැලකූ විට මෙම පුහුණු ලාභීන් සංඛ්‍යාව 1000කට හත්දෙනෙකු පමණි. මෙය සාර්ථක දායකත්වයක් දැයි විමසීමට නම් අන් ආයතනයන්හි දායකත්වය සමගද සැසඳීමක් කළ යුතුය. වෘත්තීය මාර්ගෝපදේශන වැඩ සටහන් ක්‍රියත්මක වීම මැනැවින් ඉටු නොවන්නේද සම්පත් ඌනතාව නිසාය. පාඨමාලා සඳහා සහභාගී වන සිසුන් මෙම පාඨමාලා තේරීමේදී ඔවුන්ගේ පවුල් පසුබිමද බලපා ඇතිබව මෙම අධ්‍යයනයේදී අනාවරණය විය. එසේම සිසුන් සඳහා සුවිශේෂී වැඩ සටහන් ලෙස ආගමික, සෞඛ්‍යයමය සහ ක්‍රීඩා වැඩ සටහන් ද ක්‍රියාත්මක වන බවද මෙහිදී අනාවරණය විය. පාඨමාලා හැදෑරීමෙන් පසුව පසු විපරමක් සිදුකෙරෙන බවක් සිසුන්ගෙන් ප්‍රකාශ නොවිය. එසේම හදාරන ලද පාඨමාලාවට හාත්පසින්ම වෙනස් වූ ක්ෂේත්‍රයක රැකියාවන් කරනු ලබන පාඨමාලා නිමකළ සිසුන් ද මෙහි දී දක්නට ලැබුණි.

වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව සාර්ථකව ඉටුකර ගැනීමට මෙම අධ්‍යයනය තුළින් නව යෝජනා ඉදිරිපත් කරනු ලැබිය. ඒවා අතර පොදු අරමුණු පද්ධතියක්, පාඨමාලා ඇගැයීම සඳහා පොදු පිරික්සුම් පතක් සහ ආකෘතියක් යෝජනා කර තිබේ. එසේම පෞද්ගලික අංශය වෘත්තීය පුහුණුව

සඳහා භාවිතා කිරීම සහ ශිල්පීය දක්ෂතා අරමුදලක් බිහි කිරීම සහ කරුණු ද ඉදිරිපත් කර තිබේ. එපමණකුදු නොව වෘත්තීය පුහුණු වැඩසටහන් වලදී සහ අනෙකුත් අධ්‍යාපනික වැඩසටහන් වලදී ජාත්‍යන්තර භාෂාවක් භාවිත කිරීම, ලැදියා සහ සහජ හැකියාවන්ට අනුව වෘත්තීය පුහුණුවක් තෝරාදීම, ගෝලීයකරණය සහ නව වෙළඳපොළ ප්‍රවණතා හමුවේ වැදගත් වෘත්තීය ක්ෂේත්‍ර හතක් හඳුනා ගෙන ඊට අදාල පුහුණු කිරීම් කිරීමට ද මෙම පර්යේෂණයේදී යෝජනා කර ඇත.

එසේම මෙම පර්යේෂණය මගින් අනාගත පර්යේෂණ සඳහා ද යෝජනා ඉදිරිපත් කර තිබේ. ඒවා නම් පාඨමාලා හැරගිය සිසුන් ගැන අධ්‍යයනයක් කිරීම, ගෝලීයකරණය හමුවේ නව වෘත්තීය ප්‍රවණතා වෙනස්වීම සහ බලපෑම සම්බන්ධව අධ්‍යයනය කිරීම, පුහුණු පාඨමාලාවන්හි පිරිවැය ඵලදායිතාවය සම්බන්ධව පර්යේෂණ කිරීම සහ වෘත්තීන් තෝරාගැනීමට උපකාරීවන උපකරණයක් නිර්මාණය කිරීම යනාදිය වේ.